

IWAY (අයි වේ) ප්‍රමිතිය

# නවාතැන් පහසුකම් අංශය

*නවාතැන් පහසුකම් සඳහා සුවිශේෂ වූ පොදු අංශයට අතිරේක අවශ්‍යතා*

පොදු අංශය තුළ අඩංගු වූ අනෙකුත් සෑම අවශ්‍යතාවයක්ම නවාතැන් පහසුකම් සහ ප්‍රජා පහසුකම් සඳහා සමානව අදාළ වේ (උදා: හදිසි අවස්ථා කළමනාකරණය, ගොඩනැගිලි සහ විදුලි සුරක්ෂිතභාවය).

මෙම ලේඛනය IWAY සම්මත නවාතැන් අංශයේ (Standard Accommodation Section) පරිවර්තනයකි, සංස්කරණය 6.0. මේ පරිවර්තනය තොරතුරු ලබා ගැනීමේ අරමුණ සඳහා පමණක් වන අතර ගිවිසුම්කර ලේඛනයක් ලෙස දිස් විය නොහැකිය. එකම නිල ලේඛනය වන්නේ ඉංග්‍රීසි අනුවාදය පමණක් වන අතර භාෂණ පරිවර්තනයේදී, ආරවුල් සහ වෙනත් එකඟ නොවීම් වල ඇති වන වෙනස්කම් වලදී යොමු විය යුතු ලේඛනය වේ.

**6.0 සංස්කරණය 2019 සැප්තැම්බර් ප්‍රකාශිත - © Inter IKEA Systems B.V. 2019 (ඉන්ටර් අයිකියා සිස්ටම්ස් බී.වී.2019)**

# 3 ළමුන් සුරක්ෂිත කරනු ලබන අතර සේවය, ඉගෙනීම සහ පවුල් ජීවිතය සඳහා අනුග්‍රහ දක්වනු ලැබේ.

## ළමුන් සුරැකීම

මූලික (BASIC)

A 3.1 නවාතැන් පහසුකම් තුළ ජීවත් වන ළමුන්ට උපද්‍රව සහිත ප්‍රදේශ වෙත ප්‍රවේශය නැත.

## පවුල් ජීවිතය සඳහා අවස්ථා

අනර්ඝ (EXCELLENT)

A 3.2 පවුල් ජීවිතයට අනුග්‍රහ කෙරේ, අවම වශයෙන්:

- පවුල් සඳහා නවාතැන් පහසුකම් සැපයීමෙන්.
- වෙනත් ආකාර නොමැති අවස්ථාවන්හි සේවකයින්ගේළමුන් සඳහා අධ්‍යාපන අවස්ථා සහ පාසල් කාලයෙන් පසු වැඩසටහන් පිළියෙළ කිරීම.
- ළමුන්ට ක්‍රීඩා කිරීමට ආරක්ෂිත ප්‍රදේශ තබා ගැනීම.

# 7 සේවා සහ ජීවන තත්ත්ව යෝග්‍ය වේ

## නේවාසිකයින්ගේ අයිතිවාසිකම්

**කළ යුතු (MUST)**

A 7.1 නියම කරන ලද නවාතැන් පහසුකම් වල වාසය කිරීම සේවකයින්ගෙන් අවශ්‍ය කාරණයක් නොවේ.

A 7.2 ඕනෑම මොහොතක නවාතැන් පහසුකම් හැර යාමේ අයිතිය නේවසිකයින් සතුව ඇත.

**මූලික (BASIC)**

A 7.3 නේවාසිකයින් තම අයිතිවාසිකම් සහ බැදීම්, නවාතැන් පහසුකම් වල නීති පිටපතක් සමඟ සපයා දී තිබෙන බවඅවබෝධ කරගනියි.

A 7.4 නේවාසිකයින්ට දැරීමට සිදු වූ සෑම නවාතැන් පහසුකමකම වියදම් මෙන්ම ඔවුන් සිදුකළ ගෙවීම් වල සාක්ෂි අනුබණ්ඩයක් ලබාදෙනු ලැබේ.

A 7.5 නවාතැන් පහසුකම් සඳහා වියදම් වෙළඳපළ සාමාන්‍ය ගාස්තු නොඉක්මවයි.

**උසස් (ADVANCED)**

A 7.6 බැංකු සේවා, බඩු මිලට ගැනීමේ සේවා හෝ සෞඛ්‍යාරක්ෂාව වැනි පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වනු ලැබේ.

## නවාතැන් පහසුකම්

**මූලික (BASIC)**

A 7.7 නවාතැන් පහසුකම් ශක්තිමත් ගොඩනැංවීම් වන අතර ස්වභාවික සහ කෘත්‍රිම ආලෝකය, බාධා රහිත විදුලිබල සැපයුමක්, ජල සැපයුමක්, කාලගුණ තත්ත්වයන්ට ඔරොත්තු දෙන ආරක්ෂාවක්, වාතාශ්‍රය සහ අවශ්‍ය වූ විට තාපන පහසුකම් සහිත වේ.

A 7.8 වාතැන් පහසුකම් අධි අවදානම් මෙහෙයුම් සිදුකරන ගොඩනැගිල්ලක පිහිටා නැත. නවාතැන් පහසුකම් අධික ශබ්ද මූලාශ්‍රයන්ගෙන් ඉවත් වූ පෙදෙස්හි පිහිටා ඇත.

## පුද්ගලික ජීවන අවකාශය

**මූලික (BASIC)**

A 7.9 එකම ගොඩනැගිල්ලක් තුළ පුරුෂයින්ට සහ කාන්තාවන්ට නවාතැන් පහසුකම් ලබා දී තිබේ නම්, නේවාසිකයින් ද්විත්ත්ව කාමරයක් බෙදා ගැනීමට තීරණය කරන්නේ නම් හැර එක් එක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වෙන් වූ කාමර ලබා දෙනු ලැබේ.

A 7.10 සෑම කාමරයක් ම අවම වශයෙන් නේවාසිකයින් ගණන වර්ග මීටර 3.8 න් ගුණ කිරීමෙන් ලැබෙන වර්ගඵලය වේ. සීලිමේ උස අවම වශයෙන් මීටර 2.1 වේ. කාමර බෙදා ගෙන තිබේ නම්, තිබෙන අවකාශය කොපමණ වුවත් රැඳී සිටිය හැකි උපරිම පුද්ගලයින් සංඛ්‍යාව 8කි.

A 7.11 සෑම නේවාසිකයෙකුටම ඔහුට/ඇයට හිමිවන ඇඳක් සහ මෙට්ටයක් හෝ නිදන පැදුරක්, වටිනා දේ තබා තැබීමට අගුළු දැමිය හැකි පුද්ගලික ගබඩා අවකාශයක්, වෙනත් පුද්ගලික දේවල් තැබීමට පුද්ගලික ගබඩා අවකාශයක් සහ ඔවුන්ගේ කාමරය වෙත යතුරක් හෝ ඒ හා සමාන දෙයක් ලබා දෙනු ලැබේ. සෑම කාමරයක්ම ඇතුළතින් මෙන්ම පිටතින් ද අගුළු දැමිය හැකිය.

**උසස් (ADVANCED)**

A 7.12 බෙදාගනු ලබන කාමර සඳහා, නේවාසිකයින්ගේපෞද්ගලිකත්වය වැඩිදියුණු කිරීමට මිනුම් ක්‍රියාත්මක කෙරේ.

**අනර්ඝ (EXCELLENT)**

A 7.13 සේවකයින් සඳහා පුද්ගලික කාමර පහසුකම් ඇත.

## ප්‍රජා පහසුකම්

**මූලික (BASIC)**

A 7.14 නවාතැන් පහසුකම්වල ආහාර පිසීම සඳහා නියමිත වූ පිරිසිදු සහ ක්‍රියාකාරී මට්ටමේ පවතින ස්ථාන පවතී. ආහාර පිසීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා නියමිත වූ ස්ථාන වල පමණි. ආහාර පිසින ස්ථාන ආහාර සැපයීම හෝ ඒ හා සමාන දෙයක් මඟින් ආදේශනය කළ හැකිය.

A 7.15 නවාතැන් පහසුකම් වලට නේවාසිකයින් ගණනට සමානුපාතික වූ සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව වෙන් කරන ලද ෂවර් සහ වැසිකිළි පහසුකම් ඇතුළත් වේ. ෂවර් සඳහා උණු වතුර පහසුකම් තිබේ.

**උසස් (ADVANCED)**

A 7.16 විනෝද ක්‍රියා සඳහා පහසුකම් සැපයේ.

A 7.17 රෝගී නේවාසිකයින්සඳහා ප්‍රශස්ත විවේකය සහ අන් අයගෙන් හුදෙකලාවීම සඳහා යෝග්‍ය පහසුකම් ඇත.

# ශබ්දමාලාව

**නවාතැන් පහසුකම්**

පුද්ගලික ජීවන අවකාශය සහ ප්‍රජා පහසුකම් අන්තර්ගත වන, සැපයුම්කරු හෝ සැපයුම්කරු වෙනුවෙන් ලබාදෙනු ලබන (සේවා ස්ථානයේ හෝ ඉන් බැහැර, දිගු කාලීන හෝ එසේ නොවන) නිවාසන සැකසුම්. ට්‍රක් කැබින් නවාතැන් පහසුකම්. ලෙස සලකනු නොලැබේ.

**ප්‍රජා පහසුකම්**

නවාතැන් පහසුකම්වල කොටසක් වශයෙන් ලබාදෙනු ලබන, වෙනත්නේවාසිකයින් සමඟ බෙදා ගනු ලැබෙන පහසුකම. නිදසුන් වලට ඇතුළත්: බෙදාගනු ලබන මුළුතැන් ගෙවල්, ෂවර් සහ වැසිකිළි, රෙදි සෝදන ස්ථාන සහ විනෝද ක්‍රියා සිදුකරන ස්ථාන.

**නේවාසිකයා**

නවාතැන් පහසුකම් තුළ ජීවත් වන පුද්ගලයෙක්. නේවාසිකයින්ටසේවකයින් සහ, ඇතැම් අවස්ථාවල දී ඔවුන්ගේ පවුල් ද ඇතුළත් වේ.

**සේවකයා**

පූර්ණකාලීනව හෝ අර්ධ කාලීනව සේවය ලබාදීම සිදුකරන පුද්ගලයෙක්. මෙයට කුලී ගෙවීම් ලබන සේවකයින්, වෘත්තීය පුහුණුව ලබන්නන් සහ පරිවාස කාලයක් යටතේ සේවය කරන සේවකයින්, මෙන්ම වැඩ බිමෙහි සතියට පැය (18) හෝ ඊට වැඩිය සේවය සපයන උප-කොන්ත්‍රාත් සේවකයින්ඇතුළත් වේ.